# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2021
### 2024 ඔක්තෝබර්

### සමාජීය විද්‍යා පීඨය

### සංවර්ධන අධ්‍යයන (පැරණි නිර්දේශය)
(අධ්‍යයන වර්ෂ 2012/13 සිට 2016 දක්වා)

### සංවර්ධන න්‍යායන් DVST– E2015

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. සංවර්ධන ක්‍රියාවලියේ දී ජනිත වන ප්‍රායෝගික ගැටලු තිරසාරව විසඳා ගැනීම සඳහා න්‍යායාත්මක භාවිතයන් පිළිබඳව අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරන්න. (ලකුණු 20)

02. සම්භාව්‍ය සහ නව සම්භාව්‍ය ආර්ථික න්‍යායන්හි මූලික ලක්ෂණ තුලනාත්මකව පෙන්වා දෙන්න. (ලකුණු 20)

03. W.W. රෝස්ටොව් විසින් 1960 දී ඉදිරිපත් කළ ආර්ථික වර්ධන අවධි පිළිබඳ න්‍යායාත්මක විග්‍රහය උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20)

04. සංවර්ධනය වන රටවල දිගුකාලීනව පවත්නා 'ඌන සංවර්ධන' තත්ත්වයට පදනම් වූ හේතු යැපුම් න්‍යාය ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 20)

05. i. ලිබරල් ආර්ථිකයක ප්‍රධාන ලක්ෂණ හතරක් (04) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

    ii. නව ලිබරල්වාදී සංවර්ධන සුසමාදර්ශයට එල්ලවන ප්‍රධාන විවේචන දෙකක් (02) උදාහරණ ඇසුරෙන් විශ්ලේෂණය කරන්න. (ලකුණු 12)

06. සංවර්ධන ක්‍රියාවලියේ දී ස්ත්‍රියගේ කාර්යභාරය සුදුසු න්‍යායාත්මක පදනම් ඇසුරෙන් විමර්ශනය කරන්න. (ලකුණු 20)

07. ලෝක බලවතුන් අතර මතුවන අර්බුද සංවර්ධනය වන රටවලට බලපාන ආකාරය සුදුසු උදාහරණ ඇසුරෙන් විග්‍රහ කරන්න. (ලකුණු 20)

08. පහත දක්වා ඇති මාතෘකා දෙකක් (02) විස්තර කරන්න.

    i. සහභාගීත්ව සංවර්ධනය
    ii. ප්‍රාදේශීය සංවර්ධන විෂමතා
    iii. හැරඩ්-ඩූමා ආකෘතිය
    iv. තිරසාර සංවර්ධන අභිමතාර්ථ (ලකුණු 10x2=20)

****************************************